# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1507 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 03/12/2023 පැය 0930

# මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2023.12.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 75 | - | තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කොකේන් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2023.12.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මරදාන පොලිස් වසමේ ඩීන්ස් පාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 23 ක්, මත් ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන රු. 164,500/- ක මුදලක්, උන්ඩියල් ක්‍රමයට හුවමාරු කරගන්නා ලද බවට සැකකරන ඇමරිකානු ඩොලර් 9,400/- ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන** මරදාන **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි කොටස් සහ මුව මස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2023.12.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පොලිස් වසමේ මැල්ලම්කුලම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි කොටස්, ඊයම් බෝල,**

**වෙඩි බෙහෙත් සහ මුව මස් කිලෝ 20 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන මැල්ලන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**